# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජනවාරි 2025

## (304) සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

## A - කොටස

### ප්‍රශ්න අංක 01

**පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 69 වන වගන්තිය යටතේ (මෙතැන් සිට පනත ලෙස හඳුන්වනු ලැබේ) (සංශෝධිත ලෙස), 2023.09.25 වන දින ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වී 2024.03.15 වන දින නැවත ශ්‍රී ලංකාවට පැමිණ, 2024.03.25 වන දින නැවත පිටත්ව ගිය පුද්ගලයෙකුගේ වාසිකභාවය පිළිබඳ මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී.

ඒ අනුව පනතේ 69 (1) වගන්තිය ප්‍රකාරව යම් පුද්ගලයෙකු යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයෙකු ලෙස සැලකෙන්නේ එම පුද්ගලයා;

(1) ශ්‍රී ලංකාව තුළ වාසය කරයිනම්;

(2) එම වර්ෂය තුළ ශ්‍රී ලංකාව තුළ කායිකව සිටීනම් සහ එම කායිකව සිටීමේ කාලසීමාවේ හෝ කාලසීමාවල මුළු එකතුව එම වර්ෂය තුල ආරම්භ වන හෝ අවසන් වන ඕනෑම මාස 12 ක කාල සීමාවක් තුළදි දින එකසිය අසූ තුනක් (183) ක් හෝ ඊට වැඩි ගණනක් වේනම්;

(3) එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ රජයේ සේවකයෙකු හෝ නිලධාරියෙකු වේනම් සහ එම පුද්ගලයාගේ කාලාත්‍රයා එම වර්ෂය තුල විදේශයක ඇත්නම් හෝ;

(4) වෙළෙඳ නැව් පනතේ අර්ථානුකූලව, ශ්‍රී ලංකා නෞකාවක, සේවයේ නියුක්තව සිටියේ නම්, ඔහු එසේ සේවයේ සිටි කාලසීමාව තුළ,

**නිරීක්ෂණ:**

(1) සියලුම අයදුම්කරුවන් පාහේ මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සාහ කර තිබුණි.

(2) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් වාසිකභාවය පිළිබඳ නීතිය සඳහන් කරමින් ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු දී තිබුණි.

(3) ඇතැම් අයදුම්කරුවන් අදාළ පුද්ගලයාට ශ්‍රී ලංකාවේ බදු වාසිකභාවයක් ඇති බව තීරණය කර ඇතත්, දින 183 ට අදාළ නීතිය ප්‍රකාශ කිරීමට ඔවුන් අපොහොසත් විය.

(4) ශ්‍රී ලංකාවේ වාසිකයෙකු ලෙස සැලකිය යුතු දින ගණන වැරදි ලෙස සඳහන් කර තිබූ බැවින් ඇතැම් අයදුම්කරුවන්ට වාසිකභාවය පිළිබඳ නීතිය සම්බන්ධයෙන් අවබෝධයක් නොතිබුණු බව නිරීක්ෂණය විය.

**කාර්යසාධනය: කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක **02**

**<u>(a) කොටස</u>**

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද?**

2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත යටතේ සෑම බදු අය කළ හැකි පුද්ගලයෙකු විසින්ම ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) පිළිබඳ මූලික දැනුම මෙම කොටසින් පරීක්ෂා කරන ලදී. ඒ අනුව, 2024 මාර්තු 31 න් අවසන් කාර්තුව සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ගණනය කිරීම මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය විය.

**නිරීක්ෂණ:**

(1) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මුළු පිරිවැටුම මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) නිවැරදිව ගණනය කර තිබුණි.

(2) සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත යටතේ බදු අනුපාතය හඳුනා ගැනීමට ඇතැම් අයදුම්කරුවන් අසමත් වී තිබුණි.

**කාර්යසාධනය: කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

**<u>(b) කොටස</u>**

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද?**

කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත පොදු සමාගම් වල කොටස් හුවමාරුව හා සම්බන්ධ ගනුදෙනු මත බද්දක් අය කිරීම සඳහා 2005 අංක 5 දරණ මුදල් පනත යටතේ පනවන ලද කොටස් හුවමාරු බද්ද (STL) පිළිබඳ මූලික දැනුම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂාවට ලක් කරන ලදී. ඒ අනුව, කොටස් බැහැර කිරීමේදී කොටස් හුවමාරු බද්ද (STL) ගණනය කිරීම ප්‍රශ්නයේ අවශ්‍යතාවය විය.

**නිරීක්ෂණ:**

(1) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු දීමට අපොහොසත් වී තිබුණි.

(2) බොහෝ අයදුම්කරුවන් වරදවා 0.3% බදු අනුපාතය වෙනුවට 3% ලෙස වැරදි බදු අනුපාතයක් භාවිත කර තිබුණි.

**කාර්යසාධනය: කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.**

## ප්‍රශ්න අංක **03**

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද?**

මෙම නඩු තීන්දු පිළිබඳ ප්‍රශ්නය ඩාවුඩ්බෝයි එදිරිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (1979) නඩු තීන්දුවේ කරුණු මත පදනම් වේ. එයින් අපේක්ෂා කරනු ලැබුවේ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් ලාභ අලාභ 2.1 අනුපාතයකට බෙදා ගැනීම සිදුකරන අවස්ථාවක එම නඩුවට අනුකූලව පිළිතුරු සැපයීමයි. මෙහිදී සැළකිය යුතු කරුණක් වූයේ එක් හවුල්කරුවෙකු වන (**සිරිසේන**) තම පුත්‍රයා සමඟ ප්‍රධාන හවුල්කාරිත්වයේ තම ලාභ කොටස බෙදා ගැනීම සඳහා තවත් ගිවිසුමකට එළඹීමට සැලසුම් කර තිබීමයි.

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඩාවුඩ්බෝයි එදිරිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නඩු තීන්දුව අදාල කරගනිමින් **සිරිසේන** සහ ඔහුගේ පුත්‍රයා අතර ගිවිසුමේ ආදායම් බදු බලපෑම පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය විය.

ඉහත නඩුවේ කරුණු වලට අනුව, හාසීන් ඩාවූඩ්බෝයි හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් පස් දෙනාගෙන් එක් අයෙකු වූ අබාස්බෝයි ඩාවූඩ්බෝයි, හවුල් ව්‍යාපාරයෙන් පහෙන් පංගුවක් ලබා ගැනීමට හිමිකම් කීවේය. ඔහු තම දරුවන් සමග තවත් ගිවිසුමකට එළඹ ඇත්තේ එම හවුල්කාරිත්වයේ පහෙන් පංගුව බෙදා ගැනීම සඳහාය. ගිවිසුම යටතේ, හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය සහ කීර්තිනාමය එහි අභියාචනාකරු වූ ඩාවූඩ්බෝයිගේ දේපලක් වූ අතර ඒවා ඔහුගේ වෙනම වත්කම් ලෙස පැවතිය යුතුය. එම නව ගිවිසුමේ එකම වත්කම වූයේ අබ්දුල් හසීන් ඩාවූඩ්බෝයි හවුල් ව්‍යාපාරයේ පහෙන් පංගුවයි. එහෙත් මෙම ගිවිසුම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා මෙන්ම සමාලෝචන මණ්ඩලය ද ප්‍රතික්ෂේප කරන ලදී.

පළමුව, එය අභියාචනාධිකරණයට ඉදිරිපත් කළ අතර එහි තීරණය වූයේ ගිවිසුම හුදෙක් එක් හවුල් ව්‍යාපාරයක ලාභ හා අලාභ වෙනත් කිසිවක් නොමැතිව තවත් හවුල් ව්‍යාපාරයක් සමග බෙදා ගන්නේ නම් එහි වලංගු හවුල් ව්‍යාපාරයක් තිබිය නොහැකි බවයි.

අවසාන වශයෙන්, මෙම නඩුව නීතිය පිළිබඳ ප්‍රශ්නයක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ අතර, ගිවිසුම කෘතිම හා මනඃකල්පිත නොවන බවත්, එය අව්‍යාජ හා අපේ සමාජයේ ඉතා සුලභ පවුල් සැකැස්මක් ඇතුළත් කර ඇති බවත් තීරණය කරන ලදී.

කෙසේ වෙතත්, පනතේ 195 වන වගන්තිය ඉහත ආකාරයේ උප හවුල්කාරිත්ව ගිවිසුමකට ඉඩ නොදෙන්නේ, "හවුල්කාරිත්වයක් යන්නෙන් අදහස් කරන්නේ එකඟතාවය ලිඛිතව සටහන් කර ඇත්ද යන්න නොසලකා ලාභ ඉපයීමේ අරමුණින් ඒකාබද්ධව ව්‍යාපාර කරගෙන යන පුද්ගලයන් දෙදෙනෙකු හෝ සමාගම් දෙකක හෝ වැඩි ගණනකගේ එකතුවකි" යන්න නිර්වචනය කිරීමෙනි.

එබැවින්, ඉහත නිර්වචනයට ට අනුව, දරුවන් අතර පිහිටුවන ලද හවුල් ව්‍යාපාරය ලාභ ඉපයීමේ අරමුණින් පවත්වාගෙන යන්නේ නම් නීතියෙන් නියම කර ඇති උප හවුල් ව්‍යාපාරය වලංගු වේ.

**නිරීක්ෂණ:**

(1) බොහෝ අයදුම්කරුවන්ට දී ඇති ප්‍රශ්නයක කරුණු, තීරණය කළ නඩු තීන්දුවකට අදාළ කර ගන්නේ කෙසේදැයි තේරුම් ගැනීමට අපොහොසත් විය.

(2) අදාල නඩු තීන්දුව සහ පනතේ විධිවිධාන හුවා දක්වා ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අවශ්‍ය වුවද, බොහෝ අයදුම්කරුවන් එසේ කිරීමට අපොහොසත් විය.

(3) අයදුම්කරුවන්ගෙන් බහුතරයක්, ලබා දී තිබූ නඩුව ප්‍රමාණවත් ලෙස විස්තර කර නොතිබූ අතර, ඔවුන් හුදෙක් හරයාත්මක පිළිතුර ලබා දීම වෙනුවට ප්‍රශ්නයම නැවත ඉදිරිපත් කර තිබුණි.

(4) ඇතැම් අයදුම්කරුවන් නිසි සාධාරණීකරණයකින් හෝ පැහැදිලි කිරීමකින් තොරව වලංගු හවුල් ව්‍යාපාරයක් ඇති බවට නිගමනය කර තිබුණි.

(5) ලබා දී ඇති නඩුවේ කරුණු නිවැරදිව හඳුනාගෙන අපේක්ෂිත පිළිතුර, පනතේ විධිවිධාන සහ නඩු තීන්දුවේ කරුණු හුවා දක්වමින් ඉදිරිපත් කර තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි.

(6) ඇතැම් අයදුම්කරුවන් දිගු ඡේද ලියා ඇති අතර ප්‍රශ්නයම නැවත ලියා තිබු නමුත් පිළිතුරට ඇතුළත් කළ යුතු වැදගත් කරුණු සම්පූර්ණයෙන්ම මගහැර ගොස් තිබුණි.

**කාර්යසාධනය: අයදුම්කරුවන්ගේ නඩු තීන්දු සම්බන්ධ දැනුම සතුටුදායක මට්ටමක නොතිබුණි.**

## ප්‍රශ්න අංක **04**

<u>(**a**) කොටස</u>

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද?**

මෙම ප්‍රශ්නය මගින් පනතේ ii වන අංශය යටතේ රඳවා ගැනීම මත ගෙවිය යුතු අත්තිකාරම් ආදායම් බදු (AIT) පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ලදී. ඒ අනුව, අයදුම්කරුවන් පහත දෑ මත අත්තිකාරම් ආදායම් බද්ද (AIT) ගණනය කිරීම අවශ්‍ය විය;

(1) වාසිකයෙකුට කුලී ගෙවීම, සහ

(2) මේ වසරේ ලාභයෙන් ගෙවන ලද අතුරු ලාභාංශ.

**නිරීක්ෂණ:**

(1) බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයේ මෙම කොටසට පිළිතුරු සැපයීමට උත්සාහ කර නොමැත.

(2) කුලී සහ ලාභාංශ ගෙවීම සඳහා අදාළ වන අදාළ අත්තිකාරම් ආදායම් බදු (AIT) අනුපාත පිළිබඳ අයදුම්කරුවන්ගෙන් බහුතරයකට කිසිදු දැනුමක් නොතිබුණි.

**කාර්යසාධනය: අත්තිකාරම් ආදායම් බද්ද (AIT) පිළිබඳ දැනුම දුර්වල වූ අතර එම නිසා කාර්යසාධනය ද සතුටුදායක මට්ටමක නොතිබුණි.**

<u>(**b**) කොටස</u>

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද?**

අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) යෝජනා ක්‍රමය යටතේ සේවායෝජකයෙකුගේ වගකීම් තුනක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය විය.

**නිරීක්ෂණ:**

(1) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු දී තිබුණි.

(2) ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නයට අදාළ නොවන පිළිතුරු සපයා තිබුණි.

**කාර්යසාධනය: කාර්යසාධනය සතුටුදායකය.**

<u>B - කොටස</u>

## ප්‍රශ්න අංක **05**

**පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

සෙල්ලම් බඩු නිෂ්පාදනය හා විකිණීමේ නිරත වන සමාගමක 2024.03.31 න් අවසන් කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු/ (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද (VAT) ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය.

**නිරීක්ෂණ:**

(1) සෑම අයදුම්කරුවෙකුම පාහේ මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබුණි.

(2) අදාළ VAT බදු අනුපාතය ප්‍රශ්නයේ 18% ක් ලෙස ලබා දී ඇතත්, ඇතැම් අයදුම්කරුවන් ඔවුන්ගේ ගණනය කිරීම්වලදී 15% VAT බදු අනුපාතය යොදාගෙන තිබුණි.

(3) අපනයන විකුණුම් මත එකතු කල බද්ද ශූන්‍ය අනුපාතයකින් ගණනය කල යුතු වුවද බොහොමයක් අයදුම්කරුවන් වරදවා VAT බද්දක් අය කර තිබුණි.

(4) ඉතිරි ගෙවිය යුතු බද්ද ගණනය කිරීමේදී ඇතැම් අයදුම්කරුවන් පොදු කාර්යාල වියදම් යෙදවුම් බද්දක් ලෙස වරදවා අඩු කර තිබුණි.

(5) සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් බද්දට යටත් සැපයුම සහ ශුන්‍ය සැපයුම අතර වෙනස තේරුම් ගැනීමට අපොහොසත් වී තිබුණි.

(6) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් විසින් පෙර කාර්තුවේ සිට ඉදිරියට ගෙන එන ලද අතිරික්ත යෙදවුම් බද්ද සහ වාරික ගෙවීම අඩු කර දක්වා තිබුණි.

(7) ගණනය කිරීම් මගින් තමන් ලබා ගත් පිළිතුරු නිවැරදිව සඳහන් නොකිරීම නිසා බොහොමයක් අයදුම්කරුවන් ගණනය කිරීම්වල අදාළ ශීර්ෂය සඳහා ලකුණු ලබා ගැනීමට අසමත්ව තිබුණි.

(8) අයදුම්කරුවන් අතලොස්සක් VAT බදු වාර්තාවේ නිවැරදි ආකෘතිය නොසලකා හරිමින් ලෙජර් ගිණුම් භාවිතා කරමින් ප්‍රශ්නයට පිළිතුරු දී තිබුණි.

(9) ලකුණු ලබා දීමේ පටිපාටියෙහි දක්වා ඇති සියලුම පියවර අනුගමනය නොකර අයදුම්කරුවන් කිහිප දෙනෙකු නිවැරදි පිළිතුර ගණනය කර තිබුණි. එවැනි අවස්ථාවලදී, විභාග පරීක්ෂකවරුන්ට සම්පූර්ණ ලකුණු වෙන් කිරීමට නොහැකි විය.

(10) VAT බද්දේ යෙදවුම්-නිමැවුම් යාන්ත්‍රණයට අදාළ කරුණු බහුතරයක් අයදුම්කරුවන් විසින් අවබෝධ කරගෙන් තිබුණි.

**කාර්යසාධනය: VAT බද්ද පිළිබඳ දැනුම සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 06

**පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

මෙම ප්‍රශ්නය බදු වාර්තා ඉදිරිපත් කිරීම, කාර්තුමය වාරික ගෙවීම් සහ බලයලත් පුද්ගලයින් ඇතුළත් බදු පරිපාලනය සම්බන්ධයෙන් මූලික දැනුම පරීක්ෂා කරන ලදී. ඒ අනුව, අයදුම්කරුවන් විසින් පහත දෑ සඳහන් කිරීම අවශ්‍ය විය.

(1) 2023/24 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය ගොනු කිරීම සඳහා නියමිත දිනය

(2) 2023/24 වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික ගෙවීමට නියමිත දිනයන්

(3) බදුකරණ අලාභයක් ඇති විට බදු ගෙවන්නා ආදායම් වාර්තාවක් ගොනු කළ යුතුද යන්න.

(4) "බලයලත් නියෝජිතයෙකු" විය හැකි පුද්ගලයින්.

**නිරීක්ෂණ:**

(1) බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයේ කොටස් හතරම උත්සාහ කර තිබුනේ නැත.

(2) ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය ගොනු කිරීම සඳහා නියමිත දිනය බහුතරයක් දැන සිටියේ නැත.

(3) බදුකරණය පිළිබඳ වැදගත් දැනුමක් ලෙස සැලකිය හැකි කාර්තුමය වාරික ගෙවීමේ දිනයන් පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු දීමට බොහෝ අයදුම්කරුවන් අසමත් විය.

(4) බදුකරණ අලාභයක් ඇති විට ආදායම් වාර්තාවක් පිරවීමේ නිවැරදි තත්ත්වය සෑම අයදුම්කරුවෙකුම පාහේ දැන සිටියේ නැත.

(5) බොහෝ අයදුම්කරුවන් බලයලත් නියෝජිතයන් ලෙස කටයුතු කළ හැකි පුද්ගලයන් හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ඇතැම් අයදුම්කරුවන් දේශපාලනඥයන්ගේ නම් වැනි අදාළ නොවන පිළිතුරු ලබා දී තිබුණි.

**කාර්යසාධනය: බදු පරිපාලනය සම්බන්ධයෙන් කාර්යසාධනය ඉතා දුර්වල විය.**

## ප්‍රශ්න අංක 07

**පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

මෙම ප්‍රශ්නය තුලින් පනතේ 53 සිට 56 වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයක බදු පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ලදී. 2023/24 තක්සේරු වර්ෂය සඳහා පහත දෑ ඇතුලත්ව හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු ආදායම් බදු ගණනය කිරීම මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය විය.

(1) හවුල්කරුවන්ගේ වැටුප්.

(2) ගොඩනැගිල්ල සඳහා වරිපනම්.

(3) ගිණුම්කරණ ක්ෂය.

(4) පරිත්‍යාග.

(5) වෙනත් ආදායම්.

**නිරීක්ෂණ:**

(1) සෑම අයදුම්කරුවෙකුම පාහේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කළ අතර, ඔවුන්ගෙන් බහුතරයක් ප්‍රශ්නය සඳහා සාමාන්‍ය ලකුණු ලබා ගත්හ.

(2) ගිණුම්කරණ ක්ෂය වීම සඳහා නිවැරදි ගැලපීම්, ඒ සඳහා ප්‍රාග්ධන දීමනාව ගණනය කිරීම, හවුල්කරුවන්ගේ වැටුප් සහ පරිත්‍යාග බොහොමයක් අයදුම්කරුවන් විසින් නිසි ලෙස ගලපා තිබුණි.

(3) හවුල්කාරිත්ව ආදායම ගණනය කිරීමේදී වරිපනම්වලින් 50% ක් පමණක් ඉඩ නොදීමට තිබූ විටක ඇතැම් අයදුම්කරුවන් මුළු වරිපනම් වරදවා නැවත එකතු කර තිබුණි.

(4) ඇතැම් අයදුම්කරුවන් ආයෝජන ආදායම සහ රඳවා ගත් බදු (WHT) හිමිකම් නිසි ලෙස ගණනය කර නොමැත.

(5) ව්‍යාපාර ලාභය ගණනය කිරීමට අදාල ගැලපීම් සිදු කිරීමේදී බොහොමයක් අයදුම්කරුවන් ව්‍යාකුල වී තිබුණි. ඇතැම් අයදුම්කරුවන් අඩු කළ යුතු ආදායම් එකතු කර ඇති අතර ලාභයට නැවත එකතු කළ යුතු වියදම් අඩු කර ඇත.

(6) ඇතැම් අයදුම්කරුවන් ගිණුම්කරණ ලාභයට පරිත්‍යාග ආපසු එකතු කර නොමැති නමුත් සුදුසුකම් සහිත ගෙවීම් ලෙස ඒවා වැරදියට අඩු කර ඇති අතර ඇතැමුන් සුදුසුකම් සහිත ගෙවීම් යටතේ පරිත්‍යාග නොසලකා හැර තිබුණි.

(7) පළමු රු.1,000,000/ ට 0% සහ ශේෂය 6% ලෙස බදු අය කිරීම බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව සිදුකර තිබුණි. ඇතැම් අයදුම්කරුවන් බදු අනුපාත පිළිබඳ ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය විය. ඇතැම් අයදුම්කරුවන් හවුල්කාරිත්වයට බදු අය කිරීම සඳහා ප්‍රගතිශීලී අනුපාත සහ 30% සමාගම් බදු අනුපාතය භාවිතා කර තිබුණි.

(8) ඇතැම් අයදුම්කරුවන් 0% ක බද්දක් අය නොකර හවුල් දීමනාව ලෙස රු.1,000,000/- වැරදි ලෙස අඩුකර තිබුණි.

**කාර්යසාධනය: හවුල් ව්‍යාපාර බදුකරණය පිළිබඳ දැනුම සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක **08**

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද?**

2023/24 තක්සේරු වර්ෂය සඳහා සමාගම් බදුකරණය පිළිබඳ මූලික දැනුම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී. ඒ අනුව, ප්‍රශ්නයෙහි අවශ්‍යතාවය වූයේ;

(1) වාසික සමාගමක තක්සේරු කළ හැකි ආදායම, බදු අය කළ හැකි ආදායම, ගෙවිය යුතු දළ ආදායම් බද්ද සහ ගෙවිය යුතු ඉතිරි අදායම් බද්ද/ (වැඩිපුර ගෙවූ බද්ද) ගණනය කිරීම.

(2) ප්‍රකාශන ව්‍යාපාරයක නිරත වන සමාගමක ආදායම් බදු අනුපාතය තීරණය කිරීම.

(3) ව්‍යාපාර ලාභය තහවුරු කිරීමේදී පනතේ 10 වන වගන්තිය පොදු අඩු කිරීම්, 11 වන වගන්තිය යටතේ ප්‍රධාන අඩු කිරීම් සහ පනතේ 12 සිට 19 දක්වා වගන්තිය යටතේ විශේෂිත අඩු කිරීම් ප්‍රායෝගික යොදාගැනීමේ හැකියාව ඇගයීම.

**නිරීක්ෂණ:**

(1) **ලබාගත් සාමාන්‍ය ලකුණු:**

සෑම අයදුම්කරුවෙකුම පාහේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට උත්සාහ කළ අතර අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නය සඳහා සාමාන්‍ය ලකුණු ලබා ගෙන තිබුණි.

(2) **ඉදිරිපත් කිරීමේ ආකෘතිය:**

සමාගම් ආදායම් බදු ගණනය කිරීමේ ව්‍යවස්ථාපිත අන්තර්ගතයන් ඉදිරිපත් කිරීම සහ හඳුනා ගැනීම බොහෝ අයදුම්කරුවන් විසින් අවබෝධ කරගෙන ඇත. කෙසේවෙතත්, අයදුම්කරුවන කිහිප දෙනෙක් ව්‍යවස්ථාපිත අන්තර්ගතයන් සහ සමාගම් ආදායම් බදු ගණනය කිරීම සඳහා තවදුරටත් අපහසුතාවයක් පෙන්වයි.

(3) **වෙනත් ආදායම්:**

බොහෝ අයදුම්කරුවන් ව්‍යාපාරික ආදායම ගණනය කිරීමේදී ගිණුම්කරණ ලාභයෙන් වෙනත් ආදායම් මාර්ග ලෙස පොලී සහ ලාභාංශ ආදායම ඉවත් කර තිබුණි.

(4) **ගිණුම්කරණ ක්ෂය වීම, වත්කම් ඉවත් කිරීම සහ ප්‍රාග්ධන දීමනා:**

සියලුම අයදුම්කරුවන් පාහේ ගිණුම්කරණ ක්ෂය වීම ගිණුම්කරණ ලාභයට නැවත එකතු කර තිබුණි. තවද, අයදුම්කරුවන් බහුතරයක් විසින් 2020/21 තක්සේරු වර්ෂයෙහි මිලදී ගත් ගොඩනැගිලි, පිරියත සහ යන්ත්‍රෝපකරණ, කාර්යාල උපකරණ සහ පරිගණක සඳහා ප්‍රාග්ධන දීමනාව වසර 5 ක් ලෙස නිවැරදි අනුපාත යොදාගෙන තිබුණි.

අයදුම්කරුවන් බහුතරයක් යන්ත්‍ර සූත්‍ර ඉවත් කිරීමෙන් ලද ගිණුම්කරණ අලාභය, ගිණුම්කරණ ලාභයට නැවත එකතු කර නැත. එසේම, යන්ත්‍ර සූත්‍ර ඉවත් කිරීම මත තක්සේරු කළ හැකි ගාස්තු අයදුම්කරුවන්ගෙන් බහුතරයක් විසින් ගණනය කර නොමැත. කෙසේවෙතත්, ඇතැම් අයදුම්කරුවන් යන්ත්‍ර සූත්‍ර මත තක්සේරු කළ හැකි ගාස්තුව නිවැරදිව ගණනය කර තිබූ නමුත් එම මුදල ව්‍යාපාරයෙන් ලද තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී ගිණුම්කරණ ලාභයට එකතු කර නොතිබුණි.

(5) **ඉඩ නොදෙන වියදම්:**

අයදුම්කරුවන් බහුතරයක් විසින් පාරිතෝෂික සඳහා වෙන්කිරීම හා පරිත්‍යාග ගිණුම්කරණ ලාභයට නිවැරදිව නැවත එකතු කර තිබුණි. එහෙත්, LPL ක්‍රිකට් තරගාවලිය සඳහා අනුග්‍රාහකත්වය, අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගිත්ව ගාස්තු, ඩිජිටල් සන්නිවේදනයන් පිළිබඳව ඇමරිකාවේ පැවැත්වූ සම්මන්ත්‍රණය සඳහා ගුවන් ටිකට් පත් ගාස්තු සහ SOS ළමා ගම්මානයේ දැන්වීමක් නොමිලේ ප්‍රකාශයට පත් කිරීම සඳහා නිවැරදි ගැලපීම් කිරීමට බොහෝ අයදුම්කරුවන් අසමත් විය.

(6) **ඉඩදිය හැකි වියදම්:**

පාරිතෝෂික ගෙවීම බහුතරය විසින් අඩු කර තිබුණි.

(7) **ආයෝජන ආදායම:**

ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලිය බොහෝ අයදුම්කරුවන් විසින් නිවැරදිව ආයෝජන ආදායමක් ලෙස සලකනු ලැබීය. තවද, ඇතැම් අයදුම්කරුවන් විසින් ආයෝජන ආදායමක් ලෙස රඳවාගත් බදු (WHT) අඩු කර ඇති ලාභාංශ ආදායම වැරදි ලෙස සැලකිල්ලට ගෙන තිබුණි.

(8) **සුදුසුකම් ලැබීමේ ගෙවීම් සහ සහන:**

බොහොමයක් අයදුම්කරුවන් විසින් රජයට කරන ලද පරිත්‍යාගය නිසි ලෙස අඩු කර තිබුණි. එහෙත්, අනුමත පුණ්‍යායතනයකට කළ පරිත්‍යාග කිරීම බදු අය කළ හැකි ආදායමෙන් 1/5 ක් හෝ රු.500,000/- කට වඩා අඩු සීමාවට යටත්ව ගණනය කල යුතු බව බොහෝ අයදුම්කරුවන්ට අවබෝධ කරගත නොහැකි වී තිබුණි.

(9) **බදු අනුපාතය හඳුනා ගැනීම:**

නිවැරදි බදු අනුපාතය 30% ලෙස හඳුනා ගැනීම බහුතරය විසින් සිදු කරන ලදී. කෙසේ වෙතත්, අයදුම්කරුවන් කිහිප දෙනෙකු තවමත් සමාගමට අදාළ බදු ගණනය කිරීම සඳහා තනි පුද්ගල බදුකරණයට අදාළ ප්‍රගතිශීලී අනුපාත (6% සිට 36%) යොදාගෙන තිබුණි.

(10) **බදු බැර හඳුනා ගැනීම:**

කාර්තුමය වාරික ගෙවීම බහුතරයක් විසින් බදු බැරක් ලෙස අඩු කර තිබුණි. කෙසේවෙතත්, පොලිය මත රඳවා ගැනීමේ බද්ද බොහෝ අයදුම්කරුවන් විසින් අඩු කර තිබුනේ නැත.

**කාර්යසාධනය: සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 09

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද?**

මෘදුකාංග ඉංජිනේරුවෙකු ලෙස සේවය කළ වාසික පුද්ගලයෙකුගේ 2023/24 තක්සේරු වර්ෂය සඳහා පුද්ගලික ආදායම් මූලාශ්‍ර තක්සේරු කිරීම මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය විය. ආදායම් මූලාශ්‍ර අතර රැකියාවෙන්, ව්‍යාපාරයෙන් සහ ආයෝජනවලින් ලැබෙන ආදායම ඇතුළත් විය.

**නිරීක්ෂණ:**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට සෑම අයදුම්කරුවෙකුම පාහේ උත්සාහ කර තිබූ අතර, පුද්ගලික බදුකරණයට අදාලව අයදුම්කරුවන්ගේ මූලික දැනුම සතුටුදායක මට්ටමක පැවතුනි. බොහොමයක් අයදුම්කරුවන් වෙන් කරන ලද ලකුණු වලින් සාමාන්‍ය ලකුණු ලබා ගත්හ.

නිරීක්ෂණ පහත ලැයිස්තුගත කර ඇත:

**(a) රැකියාවෙන් ලද ආදායම:**

(1) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් රැකියා ආදායමට දළ වැටුප ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, ඇතැම් අයදුම්කරුවන් මාසික වැටුප පමණක් ඔවුන්ගේ ගණනය කිරීම් සඳහා යොදාගෙන තිබුණි.

(2) පෙර වසරේ කාර්යසාධනය මත පදනම්ව 2023 අප්‍රේල් ගෙවන ලද ප්‍රසාද දීමනාව බොහොමයක් අයදුම්කරුවන් විසින් රැකියා ආදායමට නිවැරදිව ඇතුළත් කර තිබුණි.

(3) බොහොමයක් අයදුම්කරුවන් විසින් ගමන් වියදම් දීමනාව සහ වාහන දීමනාව රැකියා ආදායම ලෙස නිවැරදිව සලකනු ලැබීය.

(4) සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) රැකියා ආදායමෙන් අඩු කර දක්වා තිබුණි.

**(b) ව්‍යාපාර ආදායම:**

(1) කුරුණෑගල පොල් වත්තෙන් කෘෂිකර්මාන්තයෙන් ලැබෙන ව්‍යාපාරික ආදායම බද්දෙන් නිදහස් ආදායමකි. කෙසේවෙතත්, මෙම නිදහස් කිරීම බහුතර අයදුම්කරුවන් විසින් හඳුනාගෙන නොතිබුණි.

(2) කෘෂිකර්මාන්තයෙන් ලැබෙන ව්‍යාපාර ආදායම ගණනය කිරීම සඳහා කාලය වැයවීමෙන් අයදුම්කරුවන්ට පාඩුවක් සිදුවිය.

(3) තොරතුරු තාක්ෂණ සේවාවලින් ලැබෙන අවස්ථානුකූල සේවා ආදායම ව්‍යාපාර ආදායමක් ලෙස වෙන වෙනම හඳුනාගෙන නොතිබූ අතර, බොහෝ අයදුම්කරුවන් එය ආයෝජන ආදායම යටතේ වර්ගීකරණය කර තිබුණි.

**(c) ආයෝජන ආදායම:**

(1) බොහොමයක් අයදුම්කරුවන් විසින් ස්ථාවර තැන්පතු වල පොළිය, දළ ආදායම ගණනය කිරීමෙන් පසු ආයෝජන ආදායමක් ලෙස සැලකිල්ලට ගෙන තිබුණි.

(2) බොහොමයක් අයදුම්කරුවන් ලැයිස්තුගත සමාගම් කොටස් මත ඉපයූ ලාභාංශ ආදායම නිදහස් ආදායමක් ලෙස හඳුනා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(3) දළ කුලී ආදායම ආයෝජන ආදායමක් ලෙස හඳුනා ගැනීම සතුටුදායක මට්ටමක පැවතුණි.

**(d) පොදු අතපසුවීම් සහ වැරදි:**

(1) සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් විසින් රු.1,200,000/- ක පුද්ගලික සහනය අඩු කර නොතිබුණි.

(2) ඇතැම් අයදුම්කරුවන් බදු වගකීම් ගණනය නොකර සෘජුවම බදු අය කළ හැකි ආදායමෙන් බදු බැර වැරදි ලෙස අඩු කර තිබුණි.

(3) ඇතැම් අයදුම්කරුවන් 6% සිට 36% දක්වා ප්‍රගතිශීලී අනුපාතයන් භාවිත කර ඇති අතර ඇතැම් අයදුම්කරුවන් ව්‍යාපාර ලාභය සඳහා 30% බදු අනුපාතය සමඟ ප්‍රගතිශීලී අනුපාත ඒකාබද්ධ කර තිබුණි.

(4) බොහොමයක් අයදුම්කරුවන් විසින් පොලී මත රඳවාගත් බදු (WHT) නොසලකා හැර තිබුණි.

(5) ඇතැම් අයදුම්කරුවන් මුළු තක්සේරු කළ හැකි ආදායම, සුදුසුකම්ලත් ගෙවීම් සහ සහන, බදු අය කළ හැකි ආදායම, දළ බදු වගකීම්, බදු බැර සහ ගෙවිය යුතු ඉතිරි බදු ගණනය කිරීමේදී පුද්ගල ආදායම් බදු වාර්තාවේ නිවැරදි ප්‍රවාහයන් අදාළ කරගෙන නොතිබුණි. නිදසුනක් වශයෙන්, සුදුසුකම් ලත් ගෙවීම් සහ කාර්තුමය වාරික ගෙවීම් තක්සේරු කළ හැකි ආදායමට පෙර අඩු කර තිබුණි.

(6) ඇතැම් අයදුම්කරුවන් ඉතිරි පිළිතුර සම්පූර්ණ නොකර බදු අය කළ හැකි ආදායමෙන් බදු ගණනය කිරීම නවතා තිබුණි.

(7) බොහොමයක් අයදුම්කරුවන් මුළු පිළිතුරම එකම පිටුවක දැක්වීමට උත්සාහ කර තිබුණි. මේ නිසා විභාග පරීක්ෂකවරයාට ලකුණු ලබා දීමේ දුෂ්කරතා ඇති වූයේ පෙර වැඩ පැහැදිලිව නොතිබූ බැවිනි.

**කාර්යසාධනය:** කාර්යසාධනය සතුටුදායකය.

- - -

**සමස්ත කාර්යසාධනය:**

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් VAT බද්ද, හවුල් ව්‍යාපාර බදුකරණය, සංස්ථාපිත බදුකරණය සහ පුද්ගලික බදුකරණයට අදාළ ප්‍රශ්න සඳහා සතුටුදායක ලෙස ලකුණු ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත්, නඩු තීන්දු සහ බදු පරිපාලනය යන ක්ෂේත්‍රවල ඇතැම් දුර්වල කාර්යසාධනයන් දක්නට ලැබුණි. විශේෂයෙන්ම, බදු වාර්තා ගොනු කිරීම සහ වාරික ගෙවීම් සම්බන්ධ දැනුම ඉතා දුර්වල මට්ටමක පැවතුනි.

**ඇතැම් අයදුම්කරුවන්ගේ දුර්වල කාර්යසාධනයට හේතු වූ පොදු කරුණු පහත දැක්වේ:**

(1) බදුකරණයේ සහ අදාළ බදු නීතිවල මූලික මූලධර්මවලට වඩා අංක ගණිතමය ගණනය කිරීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

(2) බදු නීති සහ එහි පසුකාලීන සංශෝධන වැනි අදාළ බදු නීති පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම.

(3) ප්‍රශ්නවලට පිළිතුරු දීමට පෙර ප්‍රශ්න පත්‍රය නිවැරදිව කියවීමට අවධානය යොමු නොකිරීම. මෙය වැරදි අවබෝධය හේතුවෙන් ප්‍රශ්නයේ ඇතැම් වැදගත් අවශ්‍යතා අමතක කිරීමට හේතු විය.

(4) විභාග කුසලතා වැඩි දියුණු කිරීමට උපකාරී වන පසුගිය ප්‍රශ්න පත්‍ර කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම.

(5) බොහෝ මූලික මූලධර්ම සහ බදු නීති නිසි ලෙස පැහැදිලි කර ඇති ස්ව-අධ්‍යයන පාඨමාලා කෙරෙහි අඩු අවධානයක් යොමු කිරීම.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේ දුර්වල කාල කළමනාකරණය සහ සමහර අයදුම්කරුවන් කුඩා ලකුණු සඳහා දීර්ඝ පිළිතුරු ලියා ඇත.

(7) සමහර යථාර්ථවාදී උපකල්පන නොතිබූ අතර යථාර්ථවාදී නොවන උපකල්පන සිදු කරන ලදී.

(8) ආකෘතිය සහ ඉදිරිපත් කිරීම ඇතුළුව පිළිතුර සංවිධානය කිරීමට එක් එක් ප්‍රශ්නයේ සැබෑ අවශ්‍යතාවය නිසි ලෙස අවබෝධ කර ගැනීමට අපොහොසත් වීම.

(9) පරීක්ෂකවරුන්ට පිළිතුරුවල කරුණු අවබෝධ කර ගැනීමට අපහසුතා ඇති කළ නොපැහැදිලි අත් අකුරු. සමහර විට පිළිතුරු ඉතා අපැහැදිලි නිසා කියවිය නොහැකි විය.

(10) පිළිතුරුවලට අදාල පෙරවැඩ අඩුවෙන් දැක්වීම හෝ ගණනය කිරීම් පෙරවැඩ සමග නිසිලෙස සම්බන්ධ කර නොතිබූ බැවින්, පරීක්ෂකවරුන්ට මුළු ලකුණු ලබාදිය නොහැකි විය.

(11) ඇතැම් අයදුම්කරුවන් ගණනය කිරීමේ ක්‍රියාවලියේදී ඔවුන් පැමිණ ඇති ඔවුන්ගේ සංඛ්‍යාවලට සහාය දැක්වීම සඳහා නිසි පරිදි පෙර වැඩ දක්වා නොතිබීම.

**වැඩිදියුණු කරගැනීම සඳහා යෝජනාඃ**

(1) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු දීමට පෙර කාල කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කිරීම, එමඟින් අයදුම්කරුවන්ට ප්‍රශ්නවල ඇතැම් වැදගත් අවශ්‍යතා අවබෝධ කර ගැනීමට ඉඩ සලසයි. වෙන් කරන ලද ප්‍රශ්න සහ ලකුණු වල අවශ්‍යතාවය මත පදනම්ව හැකි තාක් දුරට පිළිතුර සාරාංශ කිරීම අතිශයින් වැදගත් වේ.

(2) විභාග කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අතීත ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීම සහ යෝජිත පිළිතුරු පරීක්ෂා කිරීම.

(3) ප්‍රශ්න පත්‍රයේ සියලු ක්ෂේත්‍ර ආවරණය වන බැවින් ස්වයං-අධ්‍යන පොත් කෙරෙහි පූර්ණ අවධානය යොමු කිරීම.

(4) පිළිතුරු සඳහා යම් ලකුණු ලබා දීමේදී ප්‍රයෝජනවත් වන පැහැදිලි හා යථාර්ථවාදී උපකල්පන සඳහන් කිරීම. ප්‍රශ්නවල ලබා දී ඇති කරුණු වෙනස් කිරීම සඳහා යථාර්ථවාදී නොවන උපකල්පනයක් කිරීමට අයදුම්කරුවන්ට ඉඩ නොදෙන බව මතක් කර දීම වැදගත්ය.

(5) ගණනය කිරීම්වල අංක ගණිතමය නිරවද්‍යතාවයට වඩා බදුකරණයේ මූලික මූලධර්ම කෙරෙහි අවධානය යොමු කිරීම.

(6) අවශ්‍ය සෑම අවස්ථාවකදීම එක් එක් ගණනය කිරීම් සඳහා සුදුසු පෙරවැඩ සැපයීම සහ ඒවා නිසි ලෙස සම්බන්ධ කිරීම.

(7) පිළිතුරු පත්‍ර පරීක්ෂකයන් හට කරුණු පැහැදිලිව අවබෝධ කර ගැනීමට ඉඩ සලසන අත් අකුරින් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම.

(8) පිළිතුරු සැපයීමට ලබා දෙන පොතේ නව පිටුවක නව ප්‍රශ්නයක් වන පරිදි පිළිතුරු සැපයීම.

(9) අවශ්‍යතාවය පැහැදිලිව අවබෝධ කර ගැනීම සඳහා ප්‍රශ්න පත්‍රය එක් වරකට වඩා කියවන ලෙසත්, කාලය ඉතිරි වන පරිදි අදාළ නොවන පිළිතුරු සහ ගණනය කිරීම් ලිවීමෙන් වළකින ලෙසත් අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

(10) සෑම විටම ප්‍රශ්න පත්‍රය සම්පූර්ණයෙන් කියවීමට මිනිත්තු 15 ක කියවීමේ කාලය භාවිතා කර පසුව එක් එක් ප්‍රශ්නයේ විශ්වාසනීය මට්ටම මත පදනම්ව ප්‍රශ්නවලට පිළිතුරු දීමට පටන් ගන්න.

- * * * -